# අව්‍ය පද – නිපාත පද

*ක්‍රියාකාරකම 01 –*

වරහන් තුළ ඇති නිපාත පදවලින් සුදුසු පද තෝරා වාක්‍යවල හිස් තැන් පුරවන්න.

(නන්, යළිත්, හෙයින්, සැණෙකින්, පමණ, සමග,
විනා, විසින්, තුරු, වහා, නිතර, පාසා,
පිණිස, හෙවත් , අනතුරුව)

1. හමා ආ තද සුළඟ නිසා පහන් පෙළ ...................... නිවී ගියේ ය.
2. තොටියා ...... ඔරුව පැදවෙයි.
3. ලේකම්තුමිය ...................... අයුරින් උදව් කළ අයට ස්තූති කළා ය.
4. නිවාඩුව ලැබෙන ............. අප බලා සිටියේ නොඉවසිල්ලෙනි.
5. අම්මා ............... මා බලන්නට බෝඩිමට ආවා ය.
6. .............. වහින වැස්සෙන් අපට මහත් පීඩා ගෙන දෙයි.
7. ඔහු ........... වෙනත් කෙනෙකු ඒ වැඩය නොකරනු ඇත.
8. පතක් ............ නැඹිලියට සහල් ගන්න.
9. තොපි කුමක් ................. මෙහි පැමිණියෙහු ද?
10. මම අම්මා .............. පාසලට යමි.
11. ගුරුතුමිය ඇසූ පැනයට මම ................ නැගිට පිළිතුරු දුනිමි.
12. ...................... පැමිණි විවේක කාලයේ දී අපි මිතුරන් අතරට ගියෙමු.
13. වසරක් .............. පැවැත්වෙන සංස්කෘත උත්සවය මෙවර ද උත්සවශ්‍රීයෙන් පැවැත්විණි.
14. භික්ෂූහු දන් පිණ්ඩපාතයේ වඩිති.
15. පැරැන්නෝ හෙරළි ........... කොස් ගස බත ගස ලෙස ද නම් කළහ.

*ක්‍රියාකාරකම 02 –*

පහත සඳහන් වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා සුදුසු උපසර්ග පද වරහනින් තෝරන්න.

1. පිහිනුම් ශූරයා පිළිගැනීමට ...........මහත් ජනකායක් පැමිණ සිටියහ.

   (අබි, අති, අදි, අනු)

2. ....විසල් මැදුරු පෙළ නගරයේ සශ්‍රීක බව කියාපායි. (සු, උ, සූ , ස)

3. ගායිකාව ......මිහිරි ගීතයකින් සභාව ප්‍රබෝධවත් කළා ය. (ඉ, අ, ස, වි)

4. .....කසල සිතින් මල් පහන් පූජා කරමු. (වි, නි, ස, පිරි)

5. පුතාගේ .....ගුණ ඉවත් කිරීමට දෙමව්පියන් ගත් උත්සාහය නිෂ්ඵල විය.

   (සු, ස, වි, අව)

6. වැඩිහිටියන් දෙන ......දෙස් අපි හොඳින් පිළිපැදිය යුක්තෙමු. (අනු, උප, පිළි, අති)

7. ව්‍යාපෘතියේ වැඩ කටයුතු පටන් ගැනීමට ප්‍රමාද වීම නිසා එහි .....කාරීවරයා කෙරෙහි කාගේත් නොසතුට පළවිය. (අදි, අබි, අති, අධි)

8. සියලු සත්ත්වයන් .....දුක් වෙත්වා යයි අපි මෙත් සිතින් ප්‍රාර්ථනා කරමු.

   (සු, අ, වි, නි)

9. මෙවර නිදහස් උත්සවය ගාලු මුවදොර ....මුව දී පැවැත්විණි.

   (අබි, පිරි, අමු, පිළි)

10. ....දුල සඳකැන් මුළු වනයම අලංකාර කරවයි. (ප, අ, උ, වි)

**පිළිතුරු**

*ක්‍රියාකාරකම 01*

| | | |
|---|---|---|
| 1. සැණෙකින් | 2. විසින් | 3. නන් |
| 4. තුරු | 5. යළිත් | 6. නිතර |
| 7. විනා | 8. පමණ | 9. හෙයින් |
| 10. සමග | 11. වහා | 12. අනතුරු ව |
| 13. පාසා | 14. පිණිස | 15. හෙවත් |

*ක්‍රියාකාරකම 02*

| | | |
|---|---|---|
| 1. අති | 2. සු | 3. ඉ |
| 4. නි | 5. අව | 6. උප |
| 7. අදි | 8. නි | 9. අබි |
| 10. උ | | |